ශ්‍රී සුමංගල විද්‍යාලය - පානදුර

Sri Sumangala College - Panadura

## ප්‍රථම වාර පරීක්ෂණය - 2020 මාර්තු
## 1st Term Test - March 2020

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / Grade : 11 | විෂයය / Subject : බුද්ධ ධර්මය | පත්‍රය / Paper : I | කාලය / Time : පැය 01 |

නම :- ....................................................................................... පංතිය :- ...........................

සැලකිය යුතුයි :-

- අංක (1) සිට (40 ) තෙක් දී ඇති පිළිතුරු වලින් නිවරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- නිවැරදි පිළිතුරක් සඳහා ලකු-ණු 01 කි. (1 x 40 = 40)

---

1) කාලය, දීපය, දේශය, කුලය සහ මව යනු,

(i) පංච නීවරණ ධර්මයි. (ii) පංච නියාම ධර්මය

(iii) පංච මහා විලෝකනයයි. (iv) පංචේන්ද්‍රියයි.

2) බුදු රජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පසු ප්‍රකාශ කළ උදාන වාක්‍යය වන්නේ,

(i) අග්ගෝ හමස්මිලෝකස්ස යන්නයි. (ii) අනේත ජාති සංසාර යන්නයි.

(iii) චරථ භික්ඛවේ චාරිකං යන්නයි. (iv) හන්දදානි භික්ඛවේ යන්නයි.

3) බුදුරජාණන් වහන්සේ සිදුකළ "නිබද්ධ චාරිකා" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(i) විශේෂ පුද්ගලයකුට හෝ පිරිසකට පිහිටවීමට වැඩම වීමයි.

(ii) ගෙපිළි වෙලින් හමුවන අයට දහම් දෙසමින් වැඩම වීමයි.

(iii) විහාරයට පැමිණෙන සැදැහැවතුන්ට දහම් දෙසීමයි.

(iv) මධ්‍යම රාත්‍රියේ පැමිණි දෙවිවරුන්ට දහම් දෙසීමයි.

4) බුද්ධ රත්නයේත්, ධම්ම රත්නයේත්, සංඝ රත්නයේත් ගුණ රාශී පිළිවෙලින්,

(i) 8, 9, 8 වේ. (ii) 9, 6, 9 වේ.

(iii) 9, 8, 9 වේ (iv) 6, 9, 24 වේ.

5) තුන්තරා බෝධිය දහමේ හැඳින්වෙන්නේ,

(i) ශාරීරික, පාරිභෝගික, උද්දේසික යනුවෙනි.

(ii) සම්මා සම්බුද්ධ, පච්චේක සම්බුද්ධ, අරහං බුද්ධ යනුවෙනි.

(iii) පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී යනුවෙනි.

(iv) බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය යනුවෙනි.

6) සිතෙහි තරහව ඇති විට යමක් මතකයට නඟා ගත නොහැකිය. එසේ වන විට සිතෙහි ක්‍රියාත්මක වන්නේ,

(i) කාමච්ඡන්දයයි. (ii) ව්‍යාපාදයයි.

(iii) ථීන මිද්ධ (iv) විචිකිච්ඡාවයි.

7) පංචස්කන්ධය පිළිබඳ ගැඹුරින් බලමින් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ලෙස මෙනෙහි කිරීම.

(i) විපස්සනා භාවනාවයි. (ii) සමථ භාවනාවයි.

(iii) බුද්ධානුස්සති භාවනාවයි. (iv) ආනාපාන සති භාවනාවයි.

8) සිල්වත් සමාගම නමින් සංවිධානයක් සසුන නඟා සිටුවීම වෙනුවෙන් පිහිටුවා ගනු ලැබුයේ,

(i) රේරුකානේ චන්දවිමල මාහිමිපාණන් විසිනි.

(ii) වැලිවිට සරණංකර මාහිමිපාණන් විසිනි.

(iii) අනගාරික ධර්මපාලතුමා විසිනි.

(iv) බලංගොඩ ආනන්ද මෛත්‍රීය මාහිමිපාණන් විසිනි.

9) රුවන්වැලි සෑය, ලෝවාමාහාප්‍රසාදය, මිරිසවැටිය යන නිර්මාණ සිදු කරන ලද්දේ,

(i) විජය බාහු රජු (ii) මහා පරාක්‍රමබාහු රජු

(iii) දුටුගැමුණු රජු (iv) දේවානම්පියතිස්ස රජු

10) "උට්ඨානවතෝ සතිමතෝ" යනාදී ධම්ම පද ගාථාවේ සඳහන් වන "සතිමතෝ" යන්නෙහි අදහස වන්නේ,

(i) අප්‍රමාදීව කටයුතු කිරීමයි. (ii) විමසා බලා කටයුතු කිරීමයි.

(iii) තිදොරින් නිවැරදිව ක්‍රියා කිරීමයි. (iv) සිහියෙන් යුතුව ක්‍රියා කිරීමයි.

11) ගිහි බෞද්ධ පින්වතුන් ආරක්ෂා කරනු ලබන නිත්‍ය ශීලය වන්නේ,

(i) පංච ශීලයයි. (ii) ගිහි දශ ශීලයයි.

(iii) අෂ්ඨාංග උපෝසත ශීලයයි. (iv) ආජීව අෂ්ටමක ශීලයයි.

12) අටලෝ දහමට අයත් ධර්මතා 02ක් වන්නේ,

(i) ලෝභ, අලෝභ යන්නයි. (ii) කුසල, අකුසල යන්නයි.

(iii) රාග, විරාග යන්නයි. (iv) දුක, සැප යන්නයි.

13) සදිසා නමස්කාරයට අනුව ගුරුවරුන් උපමාකොට ඇත්තේ,

(i) උතුරු දිශාවටයි. (ii) දකුණු දිශාවටයි.

(iii) නැගෙනහිර දිශාවටයි. (iv) බටහිර දිශාවටයි.

14) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකමක් වන්නේ,

(i) කටයුතු සොයා බලා ඉටුකර දීමයි.

(ii) යහපත් කටයුතු වලට යොමු කිරීමයි.

(iii) සුදුසු කල්හි සම්පත් පවරා දීමයි.

(iv) තම හිත මිතුරන්ට හඳුන්වා දීමයි.

15) "ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් ද යි" බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

(i) චංකී බමුණාය (ii) ද්‍රෝන බමුණාය

(iii) භද්ධිය බමුණාය (iv) සොත්ථිය බමුණාය

16) දස අකුසල් කර්ම අතරින් කයින් සිදුවන අකුෂල් කර්මයක් වන්නේ,

(i) අවිද්‍යාවයි. (ii) ව්‍යාපාදයයි.

(iii) සම්පප්පලාපයයි. (iv) කාමමිත්‍යාචාරයයි.

17) ත්‍රිලක්ෂණයේ සඳහන් අනිත්‍ය ලක්ෂණය අනුව ලොව ඇති සියල්ල වෙනස් වීම පොදු ධර්මතාවයකි. ඒ අනුව රූපය උපමා කොට ඇත්තේ,

(i) දිය බුබුලකටය (ii) පෙණ පිඩකටය

(iii) මිරිඟුවකටය (iv) කෙසෙල් කඳකටය

18) කාම තණ්හා, භාව තණ්හා, විභව තණ්හා යනු ප්‍රභේද දක්වා ඇත්තේ,

(i) දුක්ඛ ආර්‍ය සත්‍යයයි. (ii) දුක්ඛ සමුදාර්‍ය සත්‍යයයි.

(iii) දුක්ඛ නිරෝධාර්‍ය සත්‍යයයි. (iv) දුක්ඛ නිරෝධාර්‍ය පටිපදාර්‍ය සත්‍යයයි.

19) පහත අංගවලින් ශීල ශික්ෂාවට අයත් වන්නේ,

(i) සම්මා සංකප්පයයි. (ii) සම්මා වයාමයයි.

(iii) සම්මා සමාධියයි. (iv) සම්මා කම්මන්තයයි.

20) පළමු ධර්ම සංගායනාව සඳහා අනුග්‍රහය දැක්වූයේ,

(i) ධර්මාශෝක රජතුමායි
(ii) අජාසත්ත රජතුමාය.
(iii) කණිෂ්ක රජතුමාය.
(iv) කාලාශෝක රජතුමාය.

21) ත්‍රිපිටක බුද්ධ වචනය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ,

(i) ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය.
(ii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය.
(iii) තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය.
(iv) සිව්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙසය.

22) සතර බ්‍රහ්මවිහරණ යනු,

(i) දානය, ප්‍රිය වචනය, අර්ත චර්‍යාව හා සමානාත්මතාවය
(ii) මෙත්තා, කරුණා, මුදිතා, උපේක්‍ෂාවයි.
(iii) ඡන්ත, චිත්ත, වීරිය, විමංසාවයි.
(iv) ඡන්දය, ද්වේශය, භය, මෝහයයි.

23) බුදුරජාණන් වහන්සේ පරිසරයට කළගුණ සලකමින් අනිමිස ලෝචන පූජාව පැවැත්වූයේ බුද්ධත්වයෙන්,

(i) පළමු සතියේදී ය.
(ii) දෙවන සතියේදී ය.
(iii) තුන්වන සතියේදී ය.
(iv) හතරවන සතියේදී ය.

24) බුදුන් වහන්සේ සූකර කත ලෙනෙහිදී දේශනා කළ සූත්‍රය වන්නේ,

(i) මහ මංගල සූත්‍රයයි.
(ii) රතන සූත්‍රයයි.
(iii) වේදනා පරිග්‍රහ සූත්‍රයයි.
(iv) තේවිජ්ජ සූත්‍රයයි.

25) බුදුරජාණන් වහන්සේ විසින් රෝග වැළදීමට හේතු වන කරුණු 08ක් පෙන්වා දී තිබේ. එම කරුණු දේශනා කරන ලද්දේ කුමන ස්වාමීන් වහන්සේට ද?

(i) මුගලන් ස්වාමීන් වහන්සේටය.
(ii) සැරියුත් ස්වාමීන් වහන්සේටය.
(iii) ගිරිමානන්ද ස්වාමීන් වහන්සේටය.
(iv) චුන්ද ස්වාමීන් වහන්සේටය.

26) "ආරෝග්‍යා පරමා ලාභා" ධම්ම පද ගාථාවට අනුව,

(i) ධනය යි.
(ii) නිරෝගී බවයි.
(iii) සතුට යි.
(iv) නිවන යි.

27) දැනට හමුවී ඇති කලාත්මක බවින් මුල් තැන ගන්නා සඳකඩ පහණ ඇත්තේ අනුරාධපුරයේ,

(i) බිසෝ මාළිගය අසලයි. (ii) ලෝවා මහා ප්‍රසාදය අසලයි.

(iii) ලංකාරාමය අසලයි. (iv) අභයගිරි වෙහෙර අසලයි.

28) මහින්දාගමනයත් සමඟ බුදු දහම ලංකාවේ ස්ථාපිත වීමෙන් පසු ලංකාවේ ඉදි වූ මුල්ම ස්තූපය,

(i) රුවන්වැලි දාගැබයි. (ii) මිරිසවැටි දාගැබයි.

(iii) ථූපාරාම දාගැබයි. (iv) අභයගිරි දාගැබයි.

29) අනුරාධපුර යුගයට අයත් පැරණිම සිතුවම් දක්නය ඇති ස්ථානයක් වන්නේ,

(i) දඹුලු විහාරයයි. (ii) දිඹුලාගල විහාරයයි.

(iii) තිවංක පිළිම ගෙයයි. (iv) සීගිරියයි.

30) බුදුරජාණන් වහන්සේගේ පුරිසධම්ම සාරථි ගුණය වර්ණනා කරමින් ගුරුළුගෝමි පඬිතුමා විසින් රචනා කරන ලද කෘතිය වන්නේ,

(i) බුත් සරණය. (ii) ධර්ම ප්‍රදීපතාවය.

(iii) පූජාවලියයි. (iv) අමා වතුරයි.

31) අප මහා බෝසතාණන් වහන්සේ නෙක්ඛම්ම පාරමිතාව පුරණය කළ ආකාරය පැහැදිලි වන්නේ,

(i) වෙස්සන්තර ජාතකයයි. (ii) වණ්ණුපථ ජාතකයයි.

(iii) මකාදේව ජාතකයයි. (iv) ලෝම හංස ජාතකයයි.

32) " දූරංගමං ඒකචරං - අසරීරං ගුහාසයං" යන ධම්ම පද ගාථාවෙන් කියවෙන්නේ මිනිසාගේ,

(i) හිත ගැනයි. (ii) කය ගැනයි.

(iii) වචනය ගැනයි. (iv) පංචේන්ද්‍රිය ගැනයි.

33) බුදු දහමට අනුව පුද්ගල චරිත 06 කි. ඒ අනුව තර්කාණුකූලව විමසුම් සිතින් කටයුතු කරන චරිතය වන්නේ,

(i) රාග චරිතයයි. (ii) දෝස චරිතයයි.

(iii) විතක්ක චරිතයයි. (iv) මෝහ චරිතයයි.

34) මට්ටකුණ්ඩලි, රජ්ජුමාලා වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වන්නේ බුදුන්වහන්සේ තුළ පැවිති,

(i) ගිලානෝපස්ථාන ගුණයයි.

(ii) අසරණ සරණ ගුණයයි.

(iii) සහනශීලී ගුණයයි.

(iv) අකම්ප්‍ය ගුණයයි.

35) සිදුහත් බෝසතාණන් වහන්සේ සත්‍ය ගවේෂීව සිටි සමයේ උන්වහන්සේට මුණ ගැසුණු අශ්ට සමාපත්ති ලාභීව සිටි තවුසාගේ නම කුමක් ද?

(i) භග්ගව (ii) කාලදේව

(iii) ආලාර කාලාම (iv) උද්දකරාම පුත්ත

36) බුදුන්වහන්සේට ජය ගැනීම අතිශය දුෂ්කර වූ අභියෝගය වූයේ,

(i) පස්වග තාපස පිරිසට ධර්මාවබෝධය කර වීමය.

(ii) සියළු කෙලෙස් නසා ලොව්තුරා බුද්ධත්වයට පත් වීමයි.

(iii) අගසව් තනතුරු ප්‍රධානය කිරීමටයි.

(iv) භික්ෂු සමාජය සමගි සම්පන්නව යහපත්ව පවත්වා ගැනීමටයි.

37) පසේ බුද්ධත්වයට හා අරහත් ඵලය ප්‍රාර්ථනා කරන උත්තමයන් පාරමී දහම්,

(i) විසි වැදෑරුම් හා දස වැදෑරුම් ආකාරයට පුරණු ලබයි.

(ii) තිස් වැදෑරුම් හා විසි වැදෑරුම් ආකරයට පුරණු ලබයි.

(iii) දස වැදෑරුම් හා තිස් වැදෑරුම් ආකරයට පුරණු ලබයි.

(iv) තිස් වැදෑරුම් හා දස වැදෑරුම් ආකරයට පුරණු ලබයි.

38) ප්‍රඥා පාරමිතාව දියුණු කර ගන්නා ක්‍රම 03 වන්නේ,

(i) පාරමී, උප පාරමී, පරමත්ත පාරමිය.

(ii) ආරම්භ, නික්ඛම්ම, පරක්කමය.

(iii) චින්තාමය, සූත්‍රමය, භාවනාමය.

(iv) ආරම්භ, චින්තාමය, පරමත්තය.

39) ලෝකවාසී බෞද්ධයාගේ ගෞරව වන්දනාමානයට පත් ථූපාරාම හා මහියංගන ස්ථූප,

(i) ඝටාකාරය. (ii) පද්මාකාරය.

(iii) ධාන්‍යාකාරය. (iv) ඝණ්ඨාකාරය.

40) බෝධීන් වහන්සේ වටා පියස්සක් සහිතව නිමවන ලද මණ්ඩපය, බෝධිඝර නමින් හඳුන්වන අතර කලාත්මක බවින් උසස්ම බෝධිඝරය පිහිටා ඇත්තේ,

(i) නිල්ලක්ක ගමය (ii) බිසෝ මාලිගාව අසළය.

(iii) මැදිරිගිරියේ ය. (iv) මහියංගනයේ ය.